# 2010 වර්ෂය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ පාලන වාර්තාව

## හැඳින්වීම

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මෙහෙයවීම සහ මාර්ගෝපදේශකත්වය යටතේ ක්‍රියාත්මක වන සුරාබදු දෙපාර්තමේන්තුවට, රජයේ ප්‍රතිපත්ති හා ඒවාට අදාළ සුරාබදු ආදායම් සුරැකීම හා එකතු කිරීම ඇතුළු කටයුතු සඳහා නෛතික අධිකාරය ලැබෙන්නේ ප්‍රධාන වශයෙන්ම ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 52 වෙනි අධිකාරිය වන සුරාබදු ආඥා පනතෙනි. මේ හැරුණු විට, 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතෙහි අධිකාරිය පවත්වා ගැනීමේ වගකීම හා පොලිස් හා වෙනත් අදාළ නියෝජිතායතනයන් සමග, වස, විෂ, අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පනතෙහි අධිකාරිය බලාත්මක කිරීමේ සාමූහික වගකීමද, 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම ද, දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනිවාර්ය කාර්යයන් වේ. පූර්වෝක්ත ආඥා පනත් හා අදාළ පනත්වල සහ ඒවාට අනුශාංගික නීති, රෙගුලාසි, නිවේදන, නියෝග හා විධාන ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ බලධාරී ප්‍රධාන පෙළේ නියෝජිතායතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. රටේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා වැය කිරීමට රාජ්‍ය ආදායමෙන් කොටසක් රැස්කර දීමෙන් හා එකී ව්‍යවස්ථාවන් යටතේ ගැනෙන සෑම ආකාරයකම වැරදි වැළැක්වීමෙන් හා ග්‍රහණය කිරීම තුළින් සමාජ ආරක්ෂාව සැලසීමෙහි සුවිශේෂ ජාතික මෙහෙවරක් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ.

## 2. ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාව තුළ, නීත්‍යනුකූලව නොවන මත්පැන් හා මත්ද්‍රව්‍යවලින් තොර සමාජයක් ගොඩනැගීමට දායක වීම.

## 3. මෙහෙවර

ශ්‍රී ලංකාවේ, සුරා හා දුම්කොළ කර්මාන්තයන්හි කාර්යක්ෂම පාලනයක් තුළින් ආදායම එකතු කිරීමෙනුත්, මෙකී කර්මාන්තවල නීත්‍යනුකූල නොවන නිෂ්පාදනයන් වැළැක්වීමෙන්, ශ්‍රී ලංකාවේ සංවර්ධනයට හා සමාජ සුභ සාධනයට දායකවීමත්, වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පනත ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ආරක්ෂාව ලබා දීමත් ය.

**පරමාර්ථයන් :**

අ. මත්පැන් හා දුම්කොළවලින් ලැබෙන ආදායම ආරක්ෂා කර ගැනීම.
ආ. සුරාබදු ආඥා පනත හා දුම්කොළ බදු පනත බලාත්මක කිරීම.
ඇ. වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
ඈ. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම.

**ක්‍රියාකාරකම් :**

අ. බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය, පාලනය හා ඒවායින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.
ආ. සුරාබදු ආඥා පනත සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම.
ඇ. දුම්කොළ නිෂ්පාදනාගාර අධීක්ෂණය හා පාලනය ඇතුළුව දුම්කොළ බදු පනත බලාත්මක කිරීම.
ඈ. වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පනත බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම.
ඉ. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම.

**4. සංවිධාන ව්‍යුහය**

2010.12.31 වන දිනට කාර්ය මණ්ඩලය මෙසේ විය :

| | | |
|---|---|---|
| සුරාබදු කොමසාරිස් ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (ආදායම්) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (පාලන/මානව සම්පත්)(ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (මුදල්)(ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන)(ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මුදල්)(ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අභ්‍යන්තර විගණන)(ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (ආදායම්)- වැඩ ආවරණ | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අපරාධ) - වැඩ ආවරණ) | : | 01 |
| සහකාර සුරාබදු කොමාරිස් | : | 11 |
| පරිපාලන නිලධාරි | : | 02 |
| භාෂා පරිවර්තක | : | 01 |
| සුරාබදු අධිකාරි | : | 13 |
| ප්‍රධාන සුරාබදු පරීක්ෂක | : | 25 |
| සුරාබදු පරීක්ෂක | : | 270 |
| සුරාබදු සැරයන් මේජර් | : | 14 |
| සුරාබදු සැරයන් | : | 67 |
| සුරාබදු නියාමක / කෝප්‍රල් | : | 428 |
| සුරාබදු රියදුරු | : | 70 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | : | 94 |
| අයවැය සහකාර | : | 01 |
| කාර්යාල සේවක සේවය | : | 39 |
| බංගලා භාරකරු | : | 04 |

**5. මාණ්ඩලික වෙනස්කම් :**

- කේ.එම්.එස්. කුමාරි මහත්මිය, 2010.10.15 වන දින සිට ඉංග්‍රීසි භාෂා පරිවර්තක ලෙස පත්වීම ලබා පැමිණ ඇත.
- පහත නම් සඳහන් නිලධාරීන් 2010 වර්ෂය තුළදී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

| නිලධාරියාගේ නම | තනතුර | විශ්‍රාම ගත් දිනය |
|---|---|---|
| ඩබ්.කේ.එස්. විජේසිංහ මහතා | සුරාබදු පරීක්ෂක | 2010.04.01 |
| ටී.එච්. චන්ද්‍රසේන මහතා | සුරාබදු පරීක්ෂක | 2010.11.09 |

- සුරාබදු පරීක්ෂක, එල්.පී. සිරිපාල මහතා 2010.10.30 වන දින මියයන ලදී.

**6. මානව සම්පත් සංවර්ධනය** :

සුරාබදු කොමසාරිස් (පාලන / මානව සම්පත්) යටතේ ක්‍රියාත්මක වන මෙම ඒකකයට, සහකාර සුරාබදු කොමසාරිස්වරයෙකු, සුරාබදු නියාමකවරුන් දෙදෙනෙකු, කාන්තා සුරාබදු කෝප්‍රල්වරියක්, කාන්තා සුරාබදු නියාමකවරියක් සහ කෝප්‍රල් රියදුරෙකු අනුයුක්ත කර ඇත.

දෙපාර්තමේන්තු නිලධාරින්ගේ දැනුම සහ ආකල්ප සංවර්ධනය අරමුණු කොට ගෙන, විවිධ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම සහ විදේශ ශිෂ්‍යත්ව සඳහා නිලධාරීන් යොමු කිරීම මෙම ඒකකයේ මූලික කාර්යභාරය වේ.

**සංවිධානය කළ පාඨමාලා :**

| | පාඨමාලාව | කාල සීමාව | | සහභාගි වූ නිලධාරීන් ගණන | පුහුණුව ලැබූ ආයතනය |
|---|---|---|---|---|---|
| 1. | නවක නිලධාරීන් සඳහා ගිනි අවි පුහුණුව | 2010.01.31 | 2010.02.02 | 12 | සුරාබදු විදුහල - පනාදරගම |
| 2. | නිෂ්පාදනාගාර පිළිබඳ පුහුණුව | 2010.02.22 | - | 21 | සුරාබදු ප්‍රධාන කාර්යාලය |
| 3. | සුරාබදු ස්ථානාධිපතිවරුන් සඳහාවූ පුහුණුව | 2010.04.01 | - | 56 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 4. | සුරාබදු සැරයන් මේජවරුන් සඳහාවූ පුහුණුව | 2010.04.30 | - | 57 | -එම- |
| 5. | සුරාබදු පරීක්ෂකවරුන් සඳහාවූ පුහුණුව | 2010.05.09 | 2010.05.14 | 37 | සුරාබදු විදුහල - පනාදරගම |
| 6. | සුරාබදු සැරයන් මේජවරුන් සඳහාවූ පුහුණුව | 2010.05.11 | - | 29 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 7. | සහකාර සුරාබදු කොමසාරිස්වරුන් සඳහාවූ පුහුණුව | 2010.05.13 | 2010.05.15 | 14 | සුරාබදු පරිගණක විද්‍යාගාරය |
| 8. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.06.14 | 2010.06.16 | 17 | සුරාබදු පරිගණක විද්‍යාගාරය |
| 9. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පුහුණුව | 2010.06.21 | 2010.06.23 | 24 | සුරාබදු විදුහල - පනාදරගම |
| 10. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පුහුණුව | 2010.07.02 | - | 35 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 11. | සුරාබදු කොමසාරිස්/සහකාර සුරාබදු කොමසාරිස්වරුන් සඳහාවූ විදේශ පුහුණුව | 2010.07.05 | 2010.07.09 | 05 | මලයාසියාව |
| 12. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පුහුණුව | 2010.07.15 | - | 39 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 13. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පුහුණුව | 2010.07.21 | 2010.07.23 | 17 | සුරාබදු විදුහල - පනාදරගම |
| 14. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.07.26 | 2010.07.28 | 15 | සුරාබදු පරිගණක විද්‍යාගාරය |
| 15. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පුහුණුව | 2010.08.02 | 2010.08.04 | 22 | සුරාබදු විදුහල - පනාදරගම |
| 16. | ද්‍රවිඩ සුරාබදු නියාමකවරුන් සඳහාවූ පුහුණුව | 2010.08.16 | 2010.08.18 | 38 | සුරාබදු විදුහල - පනාදරගම |
| 17. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.08.16 | 2010.08.18 | 15 | සුරාබදු පරිගණක විද්‍යාගාරය |
| 18. | කාන්තා සුරාබදු නියාමකවරියන් සඳහාවූ පුහුණුව | 2010.08.25 | 2010.08.27 | 21 | සුරාබදු විදුහල - පනාදරගම |
| 19. | සහකාර සුරාබදු කොමසාරිස්/සුරාබදු අධිකාරී/වැ.ආ. සුරාබදු කොමසාරිස්වරුන් හා සුරාබදු අධිකාරිවරුන් සඳහාවූ විදේශ පුහුණුව | 2010.08.30 | 2010.09.03 | 30 | තායිලන්තය |
| 20. | නවක සුරාබදු රියදුරන් සඳහාවූ පුහුණුව | 2010.08.31 | 2010.09.14 | 15 | සුරාබදු විදුහල - පනාදරගම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 21. | සුරාබදු පරීක්ෂකවරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.09.01 | 2010.09.03 | 22 | සුරාබදු පරිගණක විද්‍යාගාරය |
| 22. | සුරාබදු පරීක්ෂකවරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.09.15 | 2010.09.17 | 26 | -එම- |
| 23. | සුරාබදු පරීක්ෂකවරුන් සඳහාවූ පුහුණුව | 2010.09.20 | 2010.09.24 | 41 | සුරාබදු විදුහල - පනාදරගම |
| 24. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.09.20 | 2010.09.23 | 19 | සුරාබදු පරිගණක විද්‍යාගාරය |
| 25. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.09.27 | 2010.09.29 | 18 | සුරාබදු පරිගණක විද්‍යාගාරය |
| 26. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පුහුණුව | 2010.09.29 | - | 42 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 27. | ද්‍රවිඩ සුරාබදු නිලධාරීන් සඳහාවූ පුහුණුව | 2010.10.02 | 2010.10.09 | 47 | සුරාබදු විදුහල - පනාදරගම |
| 28. | ද්‍රවිඩ සුරාබදු පරීක්ෂකවරුන් සඳහාවූ පුහුණුව | 2010.10.25 | 2010.10.29 | 30 | -එම- |
| 29. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පුහුණුව | 2010.10.29 | - | 41 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| 30. | සුරාබදු පරීක්ෂකවරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.11.02 | 2010.11.04 | 22 | සුරාබදු පරිගණක විද්‍යාගාරය |
| 31. | ද්‍රවිඩ සුරාබදු පරීක්ෂකවරුන් සඳහාවූ පුහුණුව | 2010.11.07 | 2010.11.12 | 30 | සුරාබදු විදුහල - පනාදරගම |
| 32. | සුරාබදු සැරයන් මේජර්වරුන්/ සුරාබදු සැරයන්වරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.11.22 | 2010.11.24 | 24 | -එම- |
| 33. | සුරාබදු පරීක්ෂකවරුන් සඳහාවූ පරිගණක පුහුණුව | 2010.11.23 | 2010.11.25 | 24 | සුරාබදු පරිගණක විද්‍යාගාරය |
| 34. | සුරාබදු නියාමකවරුන් සඳහාවූ පුහුණුව | 2010.12.17 | - | 44 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |

## 7. යටිතල පහසුකම් සංවර්ධනය (ගොඩනැගිලි)

අ. (බාහිර ප්‍රදේශ)

| කාර්යාලය | කාර්ය ස්වභාවය | වියදම (රුපියල්) |
|---|---|---|
| සංචාරක බංගලාව - පොළොන්නරුව | අලුත්වැඩියා කිරීම | 1,370,705.08 |
| අනුරාධපුර සංචාරක බංගලාව | අලුත්වැඩියා කිරීම | 1,397,375,74 |
| සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාලය - උතුරු මැද | අලුත්වැඩියා කිරීම | 641,000.00 |
| සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාලය - වයඹ II | අලුත්වැඩියා කිරීම | 434,703.46 |
| සුරාබදු ස්ථානය - මාතලේ | අලුත්වැඩියා කිරීම | 1,264,260.46 |
| සුරාබදු ස්ථානය - මහව | ඉඩම වටා වැට ගැසීම | 50,000.00 |
| සුරාබදු ස්ථානය - ඇඹිලිපිටිය | ඉඩම වටා වැට ගැසීම | 364,142.21 |
| සංචාරක බංගලාව - නුවරඑළිය | අලුත්වැඩියා කිරීම | 2,082,300.10 |
| **මුළු වියදම** | | **7,604,487,05** |

ආ. **ප්‍රධාන කාර්යාලය - කොළඹ 2**

ආ. 2010 වසර තුළදී, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍ය නඩත්තු කටයුතු සඳහා රුපියල් 200,000/-ක් වැය කර ඇත.

ඇ. 2010 වර්ෂය තුළදී පහත සඳහන් වාහන මිලයට ගන්නා ලදී.

| වාහන අංකය | වර්ගය | මිල (රුපියල්) |
|---|---|---|
| PP 3634 | ටොයොටා සිංගල් කැබ් | 2,165,000.00 |
| PP 3636 | ටොයොටා සිංගල් කැබ් | 2,165,000.00 |
| PP 3639 | ටොයොටා සිංගල් කැබ් | 2,165,000.00 |
| PP 3608 | මිට්සුබිෂි සිංගල් කැබ් | 2,450,000.00 |
| PP 3609 | මිට්සුබිෂි සිංගල් කැබ් | 2,450,000.00 |
| PP 3610 | මිට්සුබිෂි සිංගල් කැබ් | 2,450,000.00 |
| PP 3582 | මිට්සුබිෂි සිංගල් කැබ් | 2,450,000.00 |

## 8. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

වර්තමාන සුරාබදු ප්‍රතිපත්තිය, මහින්ද චින්තන ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව සකස් වී ඇත. ඒ අනුව, මත්පැන් හා දුම්වැටි භාවිතය පාලනය සඳහා අවශ්‍ය වැඩසටහන් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මත්පැන් පරිභෝජනය අධෛර්යමත් කිරීමේ පියවරක් වශයෙන් මත්පැන් සඳහා අය කරනු ලබන සුරාබදු කිහිප අවස්ථාවකදී වැඩි කරනු ලැබී ය. එසේම, නව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම, සංචාරක ප්‍රවර්ධන අධිකාරිය අනුමත කරනු ලබන හෝටල්වලට පමණක් සීමා කර ඇත. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ ගැටලු නිරාකරණය සඳහා අදාළ පනතට සංශෝධන යෝජනා කරන ලද අතර, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත.

වගු 8.1 නව බලපත්‍ර නිකුත් කිරීම : 2003 - 2010

| වර්ෂය | නිකුත් කරන ලද බලපත්‍ර ගණන |
|---|---|
| 2003 | 185 |
| 2004 | 203 |
| 2005 | 132 |
| 2006 | 35 |
| 2007 | 42 |
| 2008 | 36 |
| 2009 | 40 |
| 2010 | 51 |

වගු 8.2 මත්පැන් නිෂ්පාදනය : 2003 - 2010

| **වර්ෂය** | **සැර මත්පැන්** | **බියර්** |
|---|---|---|
| | **ප්‍රමාණය සම්මත සැර ලීටර මිලියන** | **ප්‍රමාණය ලීටර මිලියන** |
| 2003 | 32.0 | 47.8 |
| 2004 | 34.5 | 48.3 |
| 2005 | 38.5 | 51.5 |
| 2006 | 45.4 | 46.9 |
| 2007 | 47.2 | 49.7 |
| 2008 | 45.7 | 57.3 |
| 2009 | 41.1 | 55.5 |
| 2010 | 49.0 | 71.3 |

වගු 8.3 බලපත්‍ර ගාස්තුවලින් හා උසාවි දඩවලින් එකතු කරන ලද ආදායම : 2003-2010

| **වර්ෂය** | **බලපත්‍ර ගාස්ත (රු. මිලියන)** | **උසාවි දඩ මුදල් (රු. මිලියන)** | **එකතුව (රු. මිලියන)** |
|---|---|---|---|
| 2003 | 177 | 75 | 252 |
| 2004 | 212 | 79 | 291 |
| 2005 | 231 | 91 | 322 |
| 2006 | 355 | 176 | 531 |
| 2007 | 357 | 269 | 626 |
| 2008 | 379 | 244 | 623 |
| 2009 | 384 | 196 | 580 |
| 2010 | 407 | 234 | 641 |

දෙපාර්තමේන්තුව විසින් දේශීය කර්මාන්ත සඳහා ස්ප්‍රීතු නිකුත් කිරීමේ දී, ලීටරයකට රු. 200/- ක බද්දක් ද, විදේශීය නිෂ්පාදන සඳහා ස්ප්‍රීතු නිකුත් කිරීමේ දී ලීටරයකට රු. 100/- ක බද්දක් ද අය කරනු ලැබී ය. 2010 02.17 දිනැතිව නිකුත් කරන ලද සුරාබදු නිවේදන 913 මගින්, වාණිජ කටයුතු සඳහා නිකුත් කරන ස්ප්‍රීතු ලීටර 20,000 සීමාව දක්වා ලීටරයකට රු. 200/- ක් බැගින් ද, ඊට වැඩි නිකුත් කිරීම් සඳහා ලීටරයකට රු. 500/- ක් වශයෙන් බදු ව්‍යුහය සංශෝධනය කරන ලදී. 2010.05.31 දිනැතිව නිකුත් කරන ලද සුරාබදු නිවේදන 915 මගින් වාණිජ කටයුතු සඳහා නිකුත් කරන ස්ප්‍රීතු ලීටර 20,000 දක්වා ලීටරයකට රු. 125/- ක් ද, ඊට වැඩි ප්‍රමාණ සඳහා ලීටරයකට රු. 500/- ක් ද වශයෙන් බදු ව්‍යුහය සංශෝධනය කරනු ලැබී ය. 2010.10.28 දිනැතිව නිකුත් කළ සුරාබදු නිවේදන 925 මගින් ඉහත කී බදු ව්‍යුහයන් තවදුරටත් පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී.

- ➢ මසකට ලීටර 10,000 දක්වා ලීටරයකට රු. 150/- බැගින්,
- ➢ මසකට ලීටර 10,001-20,000 දක්වා රු. 200/- බැගින්,
- ➢ මසකට ලීටර 20,000 ඉක්මවූ විට ලීටරයකට රු. 550/- බැගින්.

ඒ අනුව, ස්ප්‍රීතු නිකුත් කිරීම්වලදී බදු වශයෙන් 2010 වර්ෂයේ දී උපයා ඇති ආදායම රුපියල් මිලියන 352 කි.

සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේ දී නිකුත් කරනු ලබන අයැදුම් පත්‍රයක් සඳහා රු. 7,500/- ක මුදලක් අය කරනු ලබයි. 2010.11.19වන දින, සුරාබදු නිවේදන 926 මගින් සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කළ අතර, බලපත්‍ර ස්ථානයක් ස්ථාන මාරු කිරීමේ දී රු. 100,000/- ක මුදලක් අය කරනු ලැබේ. තවද, බලපත්‍රයක් වෙනත් පුද්ගලයෙකුට පැවරීමේ දී , ර.බී. 04 බලපත්‍රයක් සම්බන්ධයෙන් රු.1,500,000/- ක මුදලක් ද, අනෙකුත් බලපත්‍ර

සම්න්ධයෙන් රු. 200,000/- ක මුදලක් ද අය කරනු ලැබේ. මෙසේ 2010 වර්ෂයේ දී බලපත්‍ර සඳහා අයැදුම්පත්‍ර නිකුත් කිරීමෙන්, බලපත්‍ර ස්ථාන මාරු කිරීමෙන් හා බලපත්‍ර වෙනත් පුද්ගලයන්ට පැවරීමේදී අය කරන ගාස්තු වශයෙන් එකතු කර ගත් මුළු ආදායම රුපියල් 106,766,276/- කි.

## 9. සුරාබදු ව්‍යුහය :

2010 වසර තුළ තෙවතාවක් පහත සඳහන් පරිදි සුරාබදු ව්‍යුහයන් සංශෝධනය කරන ලදී.

වගුව : 9.1

| විස්තරය | ඒකකය | 2010.06.24 වන දිනට | 2010.10.29 වන දිනට | 2010.11.23 වන දිනට |
|---|---|---|---|---|
| ඉක්ෂුපාක, තල් අරක්කු, පොල් සහ පදම් කළ අරක්කු සම්මත ලීටරයකට | සම්මත ලීටර | 660/= | 710/= | 813/= |
| විදේශීය මත්පැන් සම්මත ලීටරයකට | සම්මත ලීටර | 790/= | 840/= | 953/= |
| මද්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු බියර් තොග ලීටරයකට | තොග ලීටර | 58/= | 63/= | 80/= |
| මද්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි බියර් තොග ලීටරයකට | තොග ලීටර | 74/= | 79/= | 96/= |
| වයින් ලීටරයක් සඳහා | ලීටර | 515/= | 565/= | 668/= |
| දුම්කොළ මත අයකරන බද්ද කි.ග්‍රෑ. ඒකකට | කි.ග්‍රෑ.01 කට | 10/= | 10/= | 10/= |
| බෝතල් රා | ලීටර 01 කට | 10/= | 10/= | 10/= |

වගුව : 9.2

මෑත වර්ෂවල දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් තත්ත්වය :

| වර්ෂය | ආදායම (රු. මිලියන) | වියදම (රු. මිලියන) | ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| 2001 | 6,245.471 | 148.097 | 2.37 |
| 2002 | 8,541.628 | 151.395 | 1.77 |
| 2003 | 10,719.444 | 146.415 | 1.37 |
| 2004 | 13,545.502 | 173.000 | 1.28 |
| 2005 | 16,117.555 | 211.933 | 1.31 |
| 2006 | 20,694,008 | 297.000 | 1.44 |
| 2007 | 23,755.648 | 367.580 | 1.54 |
| 2008 | 27,436.152 | 372.023 | 1.35 |
| 2009 | 28,536.727 | 418.700 | 1.46 |
| 2010 | 36,666.886 | 403.601 | 1.10 |

## 10. අභ්‍යන්තර විගණන ඒකකය :

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම ඒකකයට, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයෙකු සහ රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරීන් දෙදෙනකු අනුයුක්තව සිටී. වර්ෂය තුළ ක්‍රියාත්මක වන සුරාබදු දෙපාර්තමේන්තුවේ ආයතනික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා :-

- ➢ සුරාබදු ආඥා පනත යටතේ ආදායම් එකතු කිරීම
- ➢ මානව සම්පත් සංවර්ධනය
- ➢ තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම
- ➢ දුම්කොළ බදු පනත ක්‍රියාත්මක කිරීම
- ➢ මූල්‍ය කළමනාකරණය
- ➢ වත්කම් කළමනාකරණය

යන ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වැඩසටහන් ඔස්සේ විමර්ශන කටයුතු පවත්වා ගෙන යනු ඇත. එකී ක්ෂේත්‍ර යාකරමින් සුරාබදු ප්‍රධාන කාර්යාලයට අදාළව ලැබීම්, ගෙවීම්, සැපයුම්, සේවා සහ වත්කම් කළමනාකරණය විගණනය කිරීම අරමුණු කරගනිමින් සියලු ලැබීම්, සැපයීම්, ගෙවීම් වවුචර් පත් විගණනයට භාජනය කිරීම සහ වාහන 113 කට අදාල පිරිවැය ලේඛන පරීක්ෂා කිරීම කරන ලද අතර ප්‍රදේශීය කාර්යාල විගණන වැඩසටහන යටතේ 2010 වර්ෂය තුළදී සුරාබදු ස්ථාන, සුරාබදු අධිකාරී කාර්යාල, සුරාබදු සහකාර කොමසාරිස් කාර්යාල, නිෂ්පාදනාගාර, ස්කාගාර, ගුදම් හා රා නිෂ්පාදනාගාර ඇතුළු උප කාර්යාල 14 ක් විගණනයට ලක් කරන ලදී.

මෙමගින් අදාළ අණපනත්, සුරාබදු නිවේදන, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය මගින් නිකුත් කර ඇති උපදෙස් වලට අනුකූල නොවූ තත්ත්වයන් හඳුනා ගෙන ඊට අවශ්‍ය පිළියම් හා එබඳු අවස්ථා මගහරවා ගැනීමට අවශ්‍ය උපක්‍රම හා ක්‍රමවේදයන්ද හඳුන්වාදෙන ලදී. එම වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස සුරාබදු උපකාර්යාල වලින් රැස්කරන ආදායම් ගිණුම් ගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් හා කාර්යක්ෂම කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය දායක වීමට 2010 වසරතුළදී හැකියාව ලැබුණි. එහිදී, ආදායම් ගිණුම් ගත කිරීමේ පැවති ප්‍රමාදය වැලැක්වීමේ අරමුණින් විශේෂ බැංකු බැරපත් හඳුන්වා දෙමින් නව ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලදී. තවද අක්‍රමවත්ව පැවැති වාහන පිරිවැය ලේඛනය ක්‍රමවත් ව පවත්වා ගෙන යෑමට අවශ්‍ය උපක්‍රම හා උපදෙස් සැපයීම තුළින් කාර්යක්ෂම දෙපාර්තමේන්තු සේවයක් ලබාදීම සඳහා දායක වීමටද අභ්‍යන්තර විගණන අංශයට අවස්ථාව සැලසුණි.

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් විගණන හා කළමනාකරුණ කමිටු රැස්වීම් 04ක් 2010 වර්ෂයේ දී පවත්වා ඇත. අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල දී ගන්නා තීරණ, සියලු මාණ්ඩලික නිලධාරීන් හරහා ක්‍රියාත්මක කිරීමටත්, විගණකාධිපති හා අභ්‍යන්තර විගණන විමසුම්වලින් පැන නගින නිරීක්ෂණ හා, සම්පත් කළමනාකරණයේ දී මතුවන ගැටලු නිරාකරණය සඳහා විගණන හා කළමනාකරණ කමිටුව යොදා ගත හැකිව තිබේ.

එම ක්‍රියාදාම තුළින් ආයතනයේ ඉලක්ක හා අරමුණු කරා ළඟාවීමට සාර්ථක පිටිවහලක් අභ්‍යන්තර විගණන අංශය මගින් ලබා දීමට හැකි වුණි.

## 11. භාණ්ඩ තොග පරීක්ෂණ :

2009 වර්ෂයේ භාණ්ඩ තොග සමීක්ෂණ කටයුතු 2010 වර්ෂය තුළදී නිම කරන ලදී.

## 12. දුම්කොළ බදු පනත සහ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ සිදු කරන ලද ග්‍රහණ විස්තර "ඒ" සහ "ඒ 2" පරිශිෂ්ටයේ ඇත.

**13. සුරාබදු හිඟ ආදායම් :**

2010 වර්ෂයේ අවසානය වන විට අයවීමට ඇති හිඟ සුරාබදු ආදායම් පිළිබඳ විස්තරයක් "එ" පරිශිෂ්ටයේ ඇත. නියමිත වේලාවට සුරාබදු නොගෙවීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගතවී ඇත. මෙම බදු මුදල් එකතු කර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇත.

**14. විගණන විමසුම් :**

2010 වර්ෂය අදාළව විගණකාධිපති විසින් විගණන විමසුම් 29 ක් යොමු කර ඇති අතර, ඒ සියල්ලටම පිළිතුරු සපයා ඇත. මෙම විගණන විමසුම්වලට, බැංකු ගිණුම්, නිල ඇඳුම් රෙදි මිලට ගැනීම, තැගි අරමුදල් ගිණුම, වාහන අනතුරු සහ අක් මුදල් පිළිබඳ කරුණු ඇතුළත් විය.

**15. දෙපාර්තමේන්තු වත්කම් :**

දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි හා වත්කම් දැක්වෙන ලේඛනයක් "ඔ" පරිශිෂ්ඨයේ ඇත.

**16. තෑගි අරමුදල් ගිණුම - "ඕ" පරිශිෂ්ටය**

**17. බී අත්තිකාරම් ගිණුම - "ක" පරිශිෂ්ටය**

**18. විසර්ජන ගිණුම - "ග" පරිශිෂ්ටය**

**19. ආදායම් ගිණුම - "ජ" පරිශිෂ්ටය**

**20. වර්ෂය තුළදී භාවිතා වූ මත්පැන් බලපත්‍ර වර්ග :**

අ.

| | | |
|---|---|---|
| ර.බී 1 | : | ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බී ඒ | : | විදේශීය ස්ප්‍රීතු මෙරට නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බී බී | : | කිරි පොන්ස සහ / හෝ වයින් නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බී සී | : | රා හැර, පොල් හෝ පොල් ආශ්‍රිත වෙනත් නිෂ්පාදිතයකින් පෙරන ලද ස්ප්‍රීතුවලින් විදේශ ස්ප්‍රීතු මෙරට සෑදීමට දෙන ලද බලපත්‍රය |
| ර.බී 3 | : | තොග වෙළඳ බලපත්‍රය |
| ර.බී 4 | : | සිල්ලරට විකුණුම් බලපත්‍රය |
| ර.බී 6 | : | බියර් පෝටර් බලපත්‍රය |
| ර.බී 7 | : | හෝටල් බලපත්‍රය |
| ර.බී 8 | : | හෝටල් පීඨිකා බලපත්‍රය |
| ර.බී 9 | : | විනෝද පීඨිකා බලපත්‍රය |
| ර.බී 10 | : | දුම්රිය භෝජනාගාර බලපත්‍රය |
| ර.බී 11 | : | ආපනශාලා බලපත්‍රය |
| ර.බී 12 | : | තානායම් බලපත්‍රය |
| ර.බී 13ඒ | : | ක්‍රීඩා සමජ / සමාජශාලා බලපත්‍රය |
| ර.බී 14 | : | අවස්ථා බලපත්‍රය |

| | | |
|---|---|---|
| ර.බී 15 | : | විකුණන වේලාවන් දීර්ඝ කිරීම සඳහා දෙන අතිරේක බලපත්‍රය |
| ර.බී 16 | : | වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය |
| ර.බී 17 | : | පරිපාක ස්ප්‍රීතු බලපත්‍රය |
| ර.බී 18 | : | ඖෂධීය වයින් බලපත්‍රය |
| ර.බී 19 | : | විශේෂ බලපත්‍රය |
| ර.බී 22ඒ | : | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍රය |
| ර.බී 22බී | : | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් ස්ථානීය පරිභෝජනය සඳහා බලපත්‍රය |

ආ. නිෂ්පාදන බලපත්‍ර

පැසුණු, නොපැසුණු මී රා මැදීම, බා ගැනීම සහ නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය

- ➢ ස්කාගාර බලපත්‍රය
- ➢ විනාකිරි බලපත්‍රය
- ➢ ස්ප්‍රීතු ශෝධනය කිරීම සංයෝග කිරීම, පදම් කිරීම පිළිබඳ බලපත්‍රය

ඇ. රා එකතු කිරීම සඳහා බල පත්‍රය

- ➢ එකතු කරන ස්ථාන බලපත්‍රය

ඈ. බෝතල්ගත කිරීම සඳහා බලපත්‍රය

- ➢ පැසවූ මත්පැන්
- ➢ පෙරූ මත්පැන්

ඉ. සහාය බලපත්‍රය

ඊ. පැසුණු රා නිෂ්පාදනය කර විකිණීමේ බලපත්‍රය

උ. විදේශ සංචාරක හෝටල් සහ ආපනශාලා බලපත්‍රය

| | |
|---|---|
| "ඒ" ශ්‍රේණියේ හෝටල් | (ර.බි 7) |
| | (ර.බි 8) |
| "බී" ශ්‍රේණියේ හෝටල් | (ර.බි 7) |
| | (ර.බි 8) |
| "සී" ශ්‍රේණියේ හෝටල් | (ර.බි 7) |
| | (ර.බි 8) |
| "ඒ" ශ්‍රේණියේ හෝටල් | (ර.බි 11) |
| "බී" ශ්‍රේණියේ හෝටල් | (ර.බි 11) |
| "සී" ශ්‍රේණියේ හෝටල් | (ර.බි 11) |

ශ්‍රේණිය නොසලකා සංචාරක මණ්ඩලය අනුමත කල ස්ථාන (ර.බි. 22 බී)

ඌ. ටෙන්ඩර් මගින් විකුණනු ලබන රා තැබෑරුම්

## 21. 2010 වර්ෂයේ බලපත්‍ර දැරූ මත්පැන් නිෂ්පාදකයෝ

I. සීමාසහිත වී ඇන්ඩ් ඒ (පුද්ගලික) සමාගම, අංක 324, හයිලෙවල් පාර, ගලගෙදර, පාදුක්ක.

II. සීමාසහිත ඇක්මී ලංකා කම්පැනි, අංක 73/1, පරණ පාර, හංවැල්ල.

III. සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරී (ලංකා) සමාගම, මාවතගම.

IV. සමුපකාර ස්කාගාරය, පයාගල.
V. ක්ලැසික් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, අංක 565, මිහිඳු මාවත, මාලඹේ.
VI. සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා, අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10.
VII. හිඟුරාන ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, සමනබැද්ද, තිත්තපත්තර.
VIII. සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලර්ස් සමාගම, කොතලාවල, කඩුවෙල.
IX. සීමාසහිත ලයන් බෲවරි (පුද්ගලික) සමාගම, අංක 254, කොළඹ පාර, බියගම.
X. සීමාසහිත මනෝරි ලංකා කම්පැනි, අංක 277/1, ජයමාලපුර, ගම්පොල.
XI. සීමාසහිත මැකලම් බෲවරි (පුද්ගලික) සමාගම, පර්ල් වතුයාය, මීගොඩ.
XII. සීමාසහිත නිපොන් එක්ස්පෝ කම්පැනි, අංක 152, නාගහකන්දවත්ත, පාළුගම, දොම්පේ.
XIII. සීමාසහිත පෙරිසිල් කම්පැනි, අංක 296/10, පාර්ක් පාර, කොළඹ 5.
XIV. සීමාසහිත රන්දිය මාර්කටිං සර්විසස් (පුද්ගලික) සමාගම, අංක 7, පෙරුන්කුලිය මාවත, දන්කොටුව.
XV. සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම, අංක 255/86, කොරතොට, කඩුවෙල.
XVI. සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, අංක 7/ඊ, ඕවිටිමුල්ල, ආටිගල, තොටුපල පාර, තිත්තපත්තර, වෙල්ගම.
XVII. සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සහ සමාගම, මෙස්ටිය, වාද්දුව.
XVIII. සීමාසහිත ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සහ සමාගම, පස්සර පාර, බදුල්ල.
XIX. තික්කම් ඩිස්ටිලරීස්, අල්වායි, පේදුරුතුඩුව.
XX. සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි, මිල්ලෑව, මොරගහහේන.
XXI. වලිකාමම් ඩිස්ටිලරීස්, වංකානෙයි.
XXII. සීමාසහිත ඩබ්.එම්. මෙන්ඩිස් සමාගම, වැලිසර, රාගම.

## 22. නිෂ්පාදිත මත්පැන් ප්‍රමාණයන්

අංක 1 වගුව : මොලෑසස් අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු. ශත) |
|---|---:|---:|
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 21,614.61 | 14,372,347.22 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 2,321,444.20 | 1,526,271,420.62 |
| සීමාසහිත මනෝරි ලංකා සමාගම | 34,887.41 | 23,146,377.04 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 8,114.22 | 5,156,922.70 |
| සීමාසහිත ඌව ග්ලේන් සමාගම | 4,717.39 | 3,305,727.10 |
| ක්ලැසික් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම | 6,038.21 | 3,864,524.68 |
| සීමාසහිත ඩබ්.එම්. මෙන්ඩිස් සහ සමාගම | 185,899.11 | 122,406,765.01 |
| සීමාසහිත පෙරිසිල් සමාගම | 38,360.63 | 31,187,192.19 |
| **එකතුව** | **2,621,075.78** | **1,729,711,276.56** |

අංක 2 වගුව : පොල් සහ පදම් කළ අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු. ශත) |
|---|---:|---:|
| වී ඇන්ඩ් ඒ (පුද්ගලික) සමාගම | 279.25 | 227,030.25 |
| සීමාසහිත ඇක්මී ලංකා සමාගම | 63,780.78 | 40,863,792.00 |
| සීමාසහිත පෙරිසිල් සමාගම | 480,422.71 | 320,048,351.38 |
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 1,903,233.04 | 1,253,826,436.54 |

| | | |
|---|---|---|
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 27,233.11 | 18,644,050.14 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 433,708.71 | 284,561,150.41 |
| සමුපකාර ස්කාගාරය | 1,306.59 | 797,019.90 |
| රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 1,202.31 | 733,409.10 |
| සීමාසහිත මනෝරි ලංකා සමාගම | 8,957.22 | 5,957,840.28 |
| සීමාසහිත නිපෝන් එක්ස්පෝ සමාගම | 10,774.16 | 7,076,856.28 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 1,464,572.86 | 954,511,717.00 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 64,325.97 | 42,470,863.49 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 3,421.32 | 2,223,246.20 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 473,133.95 | 324,795,823.09 |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම | 1,568.95 | 1,118,850.60 |
| **එකතුව** | **4,937,920.93** | **3,257,856,436.66** |

අංක 3 වගුව : විශේෂ අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු. ශත) |
|---|---|---|
| වී ඇන්ඩ් ඒ (පුද්ගලික) සමාගම | 180,646.40 | 119,212,154.05 |
| සීමාසහිත ඇක්මී ලංකා සමාගම | 389,852.19 | 257,447,140.83 |
| සමුපකාර ස්කාගාරය | 2,655.03 | 1,619,568.30 |
| ක්ලැසික් නිෂ්පාදකයෝ | 33,066.74 | 21,664,811.10 |
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 32,989,276.56 | 21,624,299,696.14 |
| සීමාසහිත ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 464,050.30 | 305,032,756.60 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 2,290,224.52 | 1,503,047,663.77 |
| සීමාසහිත මනෝරි ලංකා සමාගම | 59,753.66 | 39,436,008.66 |
| සීමාසහිත නිපෝන් එක්ස්පෝ සමාගම | 122,708.20 | 79,320,087.60 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 391,717.19 | 249,583,466.55 |
| සීමාසහිත රන්දිය පුද්ගලික සමාගම | 132,406.69 | 83,031,088.83 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 229,174.32 | 151,469,736.85 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 150,955.54 | 95,019,446.10 |
| සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම | 58.40 | 38,544.00 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 99,748.21 | 65,325,190.13 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 146,578.31 | 97,629,429.92 |
| නිපොන් ලංකා සමාගම | 11,627.12 | 7,952,370.20 |
| **එකතුව** | **37,694,499.38** | **24,701,129,159.63** |

## 23. දේශීය නිෂ්පාදිත විදේශීය මත්පැන්

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු. ශත) |
|---|---|---|
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 83,847.77 | 65,234,282,09 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 1,751,250.07 | 1,384,925,530.49 |
| සීමාසහිත නිපෝන් එක්ස්පෝ සමාගම | 2,530.95 | 2,009,654,86 |

| | | |
|---|---|---|
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 996,274.61 | 789,921,129.34 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 1,075,247.97 | 857,821,390.03 |
| ලංකා ඩිස්ටිලරීස් සමාගම | 47,637.70 | 38,214,678.90 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 50,318.69 | 40,105,033.28 |
| **එකතුව** | **4,007,107.76** | **3,178,231,698.99** |

**24. ධාන්‍ය මත්පැන් (බියර්) මද්‍යසාර ප්‍රතිශතය 5%ට අඩු**

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් ලීටර | බදු මුදල (රු. ශත) |
|---|---|---|
| සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි ලංකා සමාගම | 881,019.48 | 47,996,088.60 |
| ලයන් බෲවරි සමාගම | 14,204,005.39 | 795,051,832.51 |
| මැකලම් බෲවරි සමාගම | 218,344.23 | 10,967,666.79 |
| **එකතුව** | **15,303,369.10** | **854,015,587.90** |

**25. ධාන්‍ය මත්පැන් (බියර්) මද්‍යසාර ප්‍රතිශතය 5%ට වැඩි**

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් ලීටර | බදු මුදල (රු. ශත) |
|---|---|---|
| සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි ලංකා සමාගම | 9,821,657.82 | 712,438,268.04 |
| ලයන් බෲවරි සමාගම | 45,848,092.41 | 3,330,983,304.73 |
| මැකලම් බෲවරි සමාගම | 431,025.69 | 28,964,604.16 |
| **එකතුව** | **56,100,775.92** | **4,072,386,176.93** |

**26. වයින් නිෂ්පාදනය**

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු. ශත) |
|---|---|---|
| හෝම් ඩිලයිට් වයින් | 97.100 | 64,862.80 |
| ලංකා වයින් පුද්ගලික සමාගම | 7,942.712 | 4,155,703.53 |
| එස්.ඩී.ටී. කැනරීස් වයින් | 22.784 | 12,873,27 |
| මේෆීල්ඩ් වයින් මැනුෆැක්චරීස් | 460.500 | 79,022.27 |
| **එකතුව** | **8,523.096** | **4,312,461.87** |

**27. සකේ නිෂ්පාදනය**

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු. ශත) |
|---|---|---|
| නිපොන් ලංකා සමාගම | 3,102.390 | 1,667,473.10 |

**28. බෝතල් රා නිෂ්පාදකයන් විසින් නිෂ්පාදනය කරන ලද රා ප්‍රමාණය සහ අය කරන ලද බදු මුදල :**

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ලීටර) | බදු මුදල (රු. ශත) |
|---|---|---|
| වයඹ සුපර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 626,690.000 | 6,266,900.00 |
| ඊගල් බෝතල් රා නිෂ්පාදනාගාරය | 547,995.000 | 5,479,950.00 |

| | | |
|---|---|---|
| එම්පයර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 7,300.000 | 73,000.00 |
| ගෝල්ඩන් ඊගල් බෝතල් රා නිෂ්පාදනාගාරය | 156,390.000 | 1,563,900.00 |
| ගෝල්ඩන් ඊගල් කැමල් බෝතල් රා නිෂ්පාදනාගාරය, කොළඹ. | 7,181.000 | 71,810.00 |
| හෝස් පවර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 416,355.000 | 4,163,550.00 |
| මනෝරි ලංකා බෝතල් රා නිෂ්පාදකයෝ | 926,220.000 | 9,262,200.00 |
| නිව් කමාන්ඩෝ බෝතල් රා නිෂ්පාදකයෝ | 135,145.000 | 1,351,450.00 |
| ෂූටින් ස්ටාර් බෝතල් රා නිෂ්පාදකයෝ | 467,955.000 | 4,679,550.00 |
| සිංහ බෝතල් රා නිෂ්පාදනාගාරය | 764,590.000 | 7,645,900.00 |
| ඒ.එම්.පී. බෝතල් රා නිෂ්පාදනාගාරය | 202,017.500 | 2,020,175.00 |
| ටී.එස්.ආර්. බෝතල් රා නිෂ්පාදනාගාරය | 575,385.000 | 5,753,850.00 |
| නොමිටා බෝතල් රා නිෂ්පාදනාගාරය | 212,505.000 | 2,125,050.00 |
| නිව්.ටී.එස්.ආර්. බෝතල් රා නිෂ්පාදනාගාරය | 220,365.000 | 2,203,650.00 |
| කමාන්ඩර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 139,525.000 | 1,395,250.00 |
| තෙල්ලිපලෙයි බෝතල් රා නිෂ්පාදනාගාරය | 21,336.520 | 213,365.20 |
| අච්චුවේලි බෝතල් රා නිෂ්පාදනාගාරය | 9,042.500 | 90,425.00 |
| මනිපායි බෝතල් රා නිෂ්පාදනාගාරය | 27,235.00 | 272,350.00 |
| වංකානෙයි තල් සංවර්ධන සමුපකාරය | 48,136.875 | 481,368.75 |
| පේදුරුතුඩුව තල් සංවර්ධන සමුපකාරය | 6,819.375 | 68,193.75 |
| චාවකච්චේරිය තල් සංවර්ධන සමුපකාරය | 24,074.375 | 240,743.75 |
| පන්ඩතරිප්පු තල් සංවර්ධන සමුපකාරය | 56,663.125 | 566,631.25 |
| කොන්ඩාවිල් තල් සංවර්ධන සමුපකාරය | 3,268.750 | 32,687.50 |
| කයිට්ස් තල් සංවර්ධන සමුපකාරය | 14,070.625 | 140,706.25 |
| යාපනය තල් සංවර්ධන සමුපකාරය | 11,633.750 | 116,337.50 |
| කරෙයිනගර් තල් සංවර්ධන සමුපකාරය | 11,508.125 | 115,081.25 |
| කරවෙඩ්ඩි තල් සංවර්ධන සමුපකාරය | 4,668.750 | 46,687.50 |
| චුන්නාකම් තල් සංවර්ධන සමුපකාරය | 14,138.375 | 141,383.75 |
| **එකතුව** | **5,658,214.645** | **56,582,146.45** |

## 29. ස්ප්‍රිතු

අංක 1 වගුව : පොල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රිතු ප්‍රමාණයන්

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිෂ්පාදිත ස්ප්‍රිතු සංශුද්ධ මද්‍යසාර ලීටර |
|---|---|---|
| ඇක්මී ස්කාගාරය | 1,192,028.400 | 79,196.400 |
| බේරුවල ස්කාගාරය | 10,415,854.000 | 790,685.000 |
| මෙස්ට්‍රිය ස්කාගාරය | 4,141,227.000 | 334,176.800 |
| වවුළුගල ස්කාගාරය | 158,501.000 | 11,982.500 |
| රොක්ලන්ඩ් ස්කාගාරය | 8,446,485.100 | 657,662.100 |
| සීදුව ස්කාගාරය | 8,487,829.400 | 640,335.170 |
| **එකතුව** | **32,841,924.900** | **2,514,037.970** |

අංක 2 වගුව : තල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතු ප්‍රමාණයන්

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිෂ්පාදිත ස්ප්‍රීතු සංශුද්ධ මද්‍යසාර ලීටර |
|---|---:|---:|
| තික්කම් ස්කාගාරය | 237,926.250 | 9,896.900 |
| වරණි ස්කාගාරය | 216,039.750 | 9,501.800 |
| වලිකාමම් ස්කාගාරය | 472,070.000 | 18,808.500 |
| **එකතුව** | **926,036.000** | **38,207.200** |

අංක 3 වගුව : තල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතුවලින් නිෂ්පාදිත තල් අරක්කු ප්‍රමාණය

| ස්කාගාරය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---:|---:|
| තික්කම් නිෂ්පාදනාගාරය | 38,568.390 | 24,502,187.40 |
| වරණි නිෂ්පාදනාගාරය | 20,930.870 | 14,082,205.43 |
| වලිකාමම් නිෂ්පාදනාගාරය | 26,521.970 | 14,830,375.57 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරිස් සමාගම | 745.200 | 490,914.00 |
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම | 10,302.670 | 6,645,277.70 |
| **එකතුව** | **97,069.100** | **60,550,960.10** |

## 30. පරිපාක ස්ප්‍රීතු නිෂ්පාදනය

| ස්කාගාරය | නිෂ්පාදන ප්‍රමාණය මද්‍යසාර තොග ලීටර |
|---|---:|
| පැලවත්ත | 4,289,259.900 |
| සෙවනගල | 2,857,262.400 |
| **එකතුව** | **7,146,522.300** |

## 31. අරක්කු නිෂ්පාදනය සඳහා නිකුත් කළ ස්ප්‍රීතු ප්‍රමාණය :

| ස්කාගාරය | තොග ලීටර |
|---|---:|
| පැලවත්ත | 2,909,490.000 |
| සෙවනගල | 1,540,000.000 |
| හිඟුරාණ - කොරාඹේ | 103,700.000 |
| **එකතුව** | **4,553,190.000** |

**32. පරිපාක ස්ප්‍රීතු (අරක්කු නිෂ්පාදනය සඳහා ආනයනය කරන ලද)**

| සමාගම | ආනයනය කළ තොග ලීටර ප්‍රමාණය |
|---|---|
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 17,662,242.000 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 2,967,100.000 |
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 638,717.000 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 953,671.000 |
| ක්ලැසික් ඩිස්ටිලරීස් සමාගම | 20,000.000 |
| නිපොන් එක්ස්පෝ සමාගම | 60,000.000 |
| මනෝරි ලංකා පුද්ගලික සමාගම | 19,600.000 |
| ඩබ්.එම්. මෙන්ඩිස් සමාගම | 22,000.000 |
| හිඟුරාණ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම | 803,600.000 |
| **එකතුව** | **23,146,930.000** |

**33. කර්මාන්තශාලා නිෂ්පාදනයන් සඳහා නිකුත් කල පරිපාක සප්‍රීතු / දුර්වල ස්ප්‍රීතු / නිහඬ ස්ප්‍රීතු**

| ස්කාගාරය | පරිපාක ස්ප්‍රීතු ලීටර | දුර්වල ස්ප්‍රීතු | නිහඬ ස්ප්‍රීතු |
|---|---|---|---|
| හිඟුරාන ස්කාගාරය, කොරොඹේ | - | 100,000.000 | 120.000 |
| පැලවත්ත | 1,348,962.750 | - | - |
| සෙවනගල | 796,213.000 | - | - |
| **එකතුව** | **2,145.175.750** | **100,000.00** | **120.000** |

**34. ස්වභාවය විකෘති ස්ප්‍රීතු ප්‍රමාණය**

2010 වසර තුල, ස්වභාවය විකෘතිත නිශ්පාදනයක්, පැලවත්ත සහ සෙවනගල සීනි ආයතනයන්හි සිදු වී නොමැත.

**35. විනාකිරි නිෂ්පාදනය**

බලපත්‍ර ලද ගස් ගණන, නිශ්පාදිත විනාකිරි ප්‍රමාණය සහ විකුණුම් මිල (ඇ) පරිශිෂ්ඨයෙහි දැක්වේ.

**36. දුම්කොළ නිෂ්පාදනය සහ බද්ද**

I. 2010 වර්ෂයෙහි නිකුත් කරන ලද දුම්කොළ ප්‍රමාණය සහ අදාළ බදු මුදල මෙසේ ය.

| නිෂ්පාදනය (කි.ග්‍රෑ) | බදු මුදල (රු.ශත) |
|---|---|
| 3,267,187.20 | 32,671,872.00 |

II. ආනයනය කළ දුම්කොළවලින් ලබා ගත් බදු මුදල් : රුපියල් 248,629.00

**37. විශේෂ මෙහෙයුම් ඒකකයේ කාර්යයන්**

**අ. <u>කොළඹ ඒකකය</u>**

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අධීක්ෂණය යටතේ, සුරාබදු අධිකාරීවරයෙකු යටතේ සුරාබදු ස්ථානාධිපති ඇතුළු සුරාබදු පරීක්ෂකවරුන් අට දෙනෙකුගෙන් හා සෙසු නිලයන් විසි එක් දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුතුව සිටී.

සුරාබදු කොමසාරිස් ජනරාල්ට ලැබෙන මහජන පැමිණිලි විමර්ශණය කිරීම හා දිවයින පුරා සුරා අපරාධ මර්දනය කිරීමේ වගකීම මෙම ඒකකයට පැවරී ඇත. ඒ අනුව, 2010 වර්ෂය තුළ මෙම ඒකකය මගින් සිදු කළ අපරාධ ග්‍රහණ සංඛ්‍යාව 2194 කි. එය, විස්තරාත්මක වශයෙන් පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| නීති විරෝධී ස්ප්‍රීතු පෙරීම් | 130 |
| නීති විරෝධී ස්ප්‍රීතු ළඟ තබා ගැනීම් | 1012 |
| නීති විරෝධී ස්ප්‍රීතු විකිණීම හා ළඟ තබා ගැනීම් | 209 |
| නීති විරෝධී රා විකිණීම හා ළඟ තබා ගැනීම් | 14 |
| නීති විරෝධී රා ළඟ තබා ගැනීම් | 114 |
| නීති විරෝධී රා විකිණීම් | 120 |
| අරක්කු ළඟ තබා ගැනීම් (බලපත්‍ර රහිත) | 02 |
| රජයේ අනුමත අරක්කු විකිණීම් (බලපත්‍ර රහිත) | 366 |
| නීති විරෝධී ලෙස ධාන්‍ය මත්පැන් හෙවත් බියර් විකිණීම් | 156 |
| නීති විරෝධී ලෙස සාදන ලද මත්පැන් ළඟ තබා ගැනීම් | 03 |
| නීති විරෝධී මත්පැන් නිපදවීමේ උපකරණ ළඟ තබා ගැනීම් | 01 |
| රජයේ අනුමත අරක්කු විකිණීම් (බලපත්‍ර රහිත / නීති විරෝධී ලෙස ධාන්‍ය මත්පැන් හෙවත් බියර් විකිණීම් | 01 |
| හෙරොයින් ළඟ තබා ගැනීම් | 18 |
| ගංජා ළඟ තබා ගැනීම් | 27 |
| තීරු බදු නොගෙවන ලද සිගරට් ළඟ තබා ගැනීම් | 21 |
| **එකතුව** | **2194** |

2010 වර්ෂය තුළදී මෙම ඒකකය මගින් සිදු කරන ලද වැටලීම්වලින්, අපරාධ වාර්තා සම්බන්ධයෙන් රජයට අයකර දුන් දඩ මුදල රුපියල් 12,997,800/- කි. බලපත්‍ර ස්ථාන 585 ක් වටලන ලද අතර, ඒවායෙහි වැරදි සම්බන්ධයෙන් රජයට අයකර දුන් සමථ ගාස්තු මුදල රුපියල් 19,816,967/- කි. ඒ අනුව, 2010 වසර තුළ දී රජයට අයකර දුන් සමස්ත ආදායම රුපියල් 32,814,767/-කි.

මෙම ඒකකය විසින් නීති විරෝධි ස්ප්‍රීතු ලීටර 6462.490 ක් හා හෙරොයින් ග්‍රෑම් 20.995ක් අත් අඩංගුවට ගන්නා ලද අතර, එම හෙරොයින් සිද්ධීන් සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩු 04 ක් පවරා ඇත. එමෙන්ම, බදු නොගෙවන ලද සිගරට් 24,010 ක් මෙම ඒකකය විසින් 2010 වසරේ දී අත් අඩංගුවට ගෙන ඇත.

**අ. <u>මධ්‍යම පළාත් ඒකකය</u>**

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සහකාර සුරාබදු කොමසාරිස් (මධ්‍යම පළාත) අධීක්ෂණය යටතේ, ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරයෙක්, සුරාබදු පරීක්ෂකවරුන් සය දෙනෙක්, සුරාබදු සැරයන්වරුන් දෙදෙනෙක්, සුරාබදු නියාමකවරුන් දස දෙනෙක්, සුරාබදු කාන්තා නියාමකවරියක් හා සුරාබදු රියදුරෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුක්තව සිටියහ. 2003 වර්ෂයේ ස්ථාපිත මෙම ඒකකය දිවයින පුරාම විශේෂිත රාජකාරීවල නියුක්තව සිටී.

මෙම ඒකකය විසින් 2010 වසර තුළ සිදු කළ ග්‍රහණයන්හි ප්‍රගති සටහනක් පහත දැක්වේ.

| ග්‍රහණය කළ අපරාධ වාර්තා සංඛ්‍යාව | අපරාධ වාර්තා යටතේ අය කළ උසාවි දඩ මුදල රුපියල් | ග්‍රහණය කල කාර්මික අපරාධ වාර්තා සංඛ්‍යාව | කාර්මික අපරාධ වාර්තා යටතේ අය කළ සමස්ත ගාස්තුව - රුපියල් |
|---|---|---|---|
| 1969 | 12,851,500.00 | 501 | 9,243,500.00 |

1969 ක් වූ අපරාධ වාර්තා, පහත දැක්වෙන අයුරින් වර්ගීකරණය වේ.

| | |
|---|---|
| නීති විරෝධී ස්ප්‍රීතු පෙරීම් | 186 |
| නීති විරෝධී ස්ප්‍රීතු ළඟ තබා ගැනීම් | 850 |
| නීති විරෝධී ස්ප්‍රීතු විකිණීම හා ළඟ තබා ගැනීම් | 230 |
| නීති විරෝධී රා විකිණීම හා ළඟ තබා ගැනීම් | 57 |
| නීති විරෝධී රා ළඟ තබා ගැනීම් | 149 |
| නීති විරෝධී රා විකිණීම් | 46 |
| අරක්කු ළඟ තබා ගැනීම් (බලපත්‍ර රහිත) | 01 |
| රජයේ අනුමත අරක්කු විකිණීම් (බලපත්‍ර රහිත) | 320 |
| නීති විරෝධී ලෙස සාදන ලද මත්පැන් ළඟ තබා ගැනීම් | 09 |
| නීති විරෝධී ලෙස සාදන ලද මත්පැන් ළඟ තබා ගැනීම් සහ විකිණීම් | 03 |
| නීති විරෝධී ලෙස අරක්කු සහ විදේශ මත්පැන් විකිණීම් | 02 |
| නීති විරෝධී ලෙස විදේශ මත්පැන් විකිණීම් | 65 |
| හෙරොයින් ළඟ තබා ගැනීම් | 02 |
| ගංජා ළඟ තබා ගැනීම් | 10 |
| කංසා හේන් වැටලීම් | 21 |
| නීති විරෝධී සිගරැට් වැටලීම් | 15 |
| බලපත්‍ර රහිතව ගස් මැදීම් | 01 |
| නීති විරෝධී ලෙස වයින් ස්ප්‍රීතු විකිණීම් | 01 |
| නීති විරෝධී ලෙස මෝදක ළඟ තබාගැනීම් | 01 |
| **එකතුව** | **1969** |

ඇ. <u>**දකුණු පළාත් ඒකකය :**</u>

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සහකාර සුරාබදු කොමසාරිස්ගේ (දකුණු පළාත) අධීක්ෂණය යටතේ, ක්‍රියාත්මක වන මෙම ඒකකය සුරාබදු ස්ථානාධිපතිවරයෙක්, සුරාබදු පරීක්ෂකවරුන් සතර දෙනෙකු ක් ද, සුරාබදු සැරයන්වරයෙක් හා සුරාබදු නියාමකවරුන් 04 කුගෙන් සමන්විත විය. අදාල වර්ෂය තුළ මෙම ඒකකය විසින් ග්‍රහණ 698ක් සහ බලපත්‍ර කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් කාර්මික අපරාධ වාර්තා 09ක් ඉදිරිපත් කර ඇත. අපරාධ වාර්තා 636ක් ඉදිරිපත් කර ඇති අතර, ඉන් නඩු 561ක් විසඳා ඇති අතර, වරෙන්තු නඩු වශයෙන් 64ක් සහ විභාග නොවූ නඩු වශයෙන් 11ක් පැවතුනි. උසාවි දඩ වශයෙන් රු3,957,100/- ක් හා කාර්මික අපරාධ වාර්තා සඳහා සමථ මුදල් වශයෙන් රු. 146,000/- ක් රජයට ආදායම ලබා දී ඇත.

698 ක් වූ අපරාධ වාර්තා, පහත දැක්වෙන අයුරින් වර්ගීකරණය වේ.

| | |
|---|---|
| නීති විරෝධී ස්ප්‍රීතු පෙරීම් | 41 |
| නීති විරෝධී ස්ප්‍රීතු ළඟ තබා ගැනීම් | 90 |
| නීති විරෝධී ස්ප්‍රීතු විකිණීම හා ළඟ තබා ගැනීම් | 38 |
| නීති විරෝධී රා ළඟ තබා ගැනීම් | 68 |
| නීති විරෝධී රා විකිණීම් | 29 |
| අරක්කු ළඟ තබා ගැනීම් (බලපත් රහිත) | 01 |
| නීති විරෝධී ලෙස නිෂ්පාදිත මත්පැන් ළඟ තබා ගැනීම් | 15 |
| නීති විරෝධී ලෙස බලපත්‍ර රහිත අරක්කු විකිණීම් | 163 |
| නීති විරෝධී බියර් විකිණීම් | 142 |
| හෙරොයින් ළඟ තබා ගැනීම් | 05 |
| ගංජා ළඟ තබා ගැනීම් | 28 |
| කංසා හේන් වැටලීම් | 61 |
| දුම්කොළ බදු පනත යටතේ සිගරැට් වැටලීම් | 14 |
| බලපත්‍ර රහිතව ගස් මැදීම් | 03 |
| **එකතුව** | **698** |

**ඈ. <u>වයඹ පළාත් ඒකකය :</u>**

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සහකාර සුරාබදු කොමසාරිස් (වයඹ පළාත) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම ඒකකය, සුරාබදු පරීක්ෂකවරුන් තිදෙනෙක්, සුරාබදු සැරයන්වරයෙක්, සුරාබදු නියාමකවරුන් සය දෙනෙකු හා සුරාබදු නියාමක රියදුරකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත ය. අදාළ වර්ෂය තුළ මෙම ඒකකය විසින්, ග්‍රහණ 901ක් සිදුකර ඇති අතර, උසාවි දඩ මුදල් වශයෙන් රු. 8,265,000/-ක මුදලක් අය කර ගෙන ඇත. සුරාබදු බලපත්‍ර ස්ථානවලට එරෙහිව කාර්මික අපරාධ වාර්තා 50ක් ඉදිරිපත් කර ඇති අතර, සමථ ගාස්තු වශයෙන් රුපියල් 730,860/- අය කර ගැනීමට සමත්ව ඇත.

901 ක් වූ අපරාධ වාර්තා, පහත දැක්වෙන අයුරින් වර්ගීකරණය වේ.

| | |
|---|---|
| නීති විරෝධී ස්ප්‍රීතු නිෂ්පාදනය | 146 |
| නීති විරෝධී ස්ප්‍රීතු විකිණීම හා ළඟ තබා ගැනීම් | 662 |
| නීති විරෝධී රා ළඟ තබා ගැනීම් | 01 |
| නීති විරෝධී මත්පැන් විකිණීම සහ විදේශ මත්පැන් විකිණීම් | 90 |
| නීති විරෝධී සිගරැට් වැටලීම් | 02 |
| **එකතුව** | **901** |

## 38. නිෂ්පාදන මෙහෙයුම් ඒකකයේ කාර්යයන් සහ ප්‍රගතිය

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ පාලනය වන මෙම ඒකකයට, සහකාර සුරාබදු කොමසාරිස්වරයෙක්, සුරාබදු පරීක්ෂකවරයෙක්, කාන්තා සුරාබදු කෝප්‍රල්වරියක්, සහ සුරාබදු රියදුරුවරයෙක් අනුයුක්තව සිටී. මීට අමතරව, ඔරුගොඩවත්ත ශ්‍රේලයින් රේගු අංගනයේ ස්ප්‍රීතු ආනයනයට සම්බන්ධ සියලු කටයුතු කිරීම පිණිස, එක් සුරාබදු පරීක්ෂකවරයෙක් ද අනුයුක්ත කර ඇත.

මෙම ඒකකයේ කාර්යභාරය වනුයේ, දිවයින පුරා විසිර පවතින සියලුම ස්කාගාර, අරක්කු, බියර් රා සහ වයින් නිෂ්පාදනාගාරවල නිෂ්පාදන කාර්යයන් අධීක්ෂණය කිරීමත්, එමගින් සුරාබදු ආදායම අයකර

ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමත්, මද්‍යසාර හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනාගාර තොරතුරු සම්බන්ධ සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යාමත්, දිවයින පුරා පිහිටි අරක්කු හා රටබීම තොග වෙළඳ බලපත්‍ර අධීක්ෂණය සහ අනාවරණය වූ වැරදි සම්බන්ධව කාර්කක අපරාධ වාර්තා ඉදිරිපත් කිරීමත්, ඔරුගොඩවත්ත ග්‍රේලයින් රේගු අංගනයේ ස්ප්‍රීතු ආනයනයට සම්බන්ධ සියලු කටයුතු නිරීක්ෂණය කිරීම මෙන්ම, සුරාබදු නීතියට අනුකූලව ඒවා පාලනය විය යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීම සහ එක් එක් නිෂ්පාදනාගාර විසින් ලබා ගෙන ඇති ස්ප්‍රීතුවලට අදාළ ගිණුම් කටයුතු අධීක්ෂණය සිදු කිරීමත් ය.

2010 වර්ෂයේ දී මෙම ඒකකයෙන් සුරාබදු බලපත්‍රධාරීන්ට එරෙහිව කාර්මික අපරාධ වාර්තා 150ක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා සමථ ගාස්තු වශයෙන් රු.9,125,500/- ක් අයකර ගෙන ඇත. වාර්ෂික අනුමත සීමාවට වඩා වැඩිපුර අපතේ ගොස් ඇති ස්ප්‍රීතු සඳහා අය කරන ලද සුරාබදු මුදල රු.6,475,201.35කි.

දෙපාර්තමේන්තුව අවශ්‍යතාවය මත නිෂ්පාදනාගාර කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීමට දායකවීමත්, බෝතල් ගත කරන ලද මධ්‍යසාර සඳහා අය කල යුතු සුරාබදු ප්‍රමාණය පිළිබඳ ඉදිරි වර්ෂය සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීමත්, මධ්‍යසාර ආශ්‍රිතව සුරාබදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන නව ව්‍යාපෘති සම්බන්ධයෙන් විශ්ලේෂණය සිදු කිරීම හා එයට අදාල සක්‍යතා අධ්‍යයනය සිදු කිරීමත් ඒ පිළිබඳවූ වාර්තාවක් අදාල අංශ වෙත යොමු කිරීමත් සිදු කරනු ලබයි.

## 39. මත්ද්‍රව්‍ය ඒකකයේ කාර්යයන්

වස විෂ අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පනත යටතේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද සුරාබදු මත්ද්‍රව්‍ය ඒකකය, කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටුවා ඇත. සුරාබදු අධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ සුරාබදු ස්ථානාධිපතිවරයෙකු, සුරාබදු පරීක්ෂකවරුන් 04 දෙනෙකු, කාන්තා සුරාබදු සැරයන්වරු 02කු, සුරාබදු නියාමකවරුන් 10 හා සුරාබදු රියදුරෙකු ඇතුළත් නිලධාරීන් 19 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් මෙම ඒකකය සමන්විත විය.

2010 වසරේ දී මෙම ඒකකය විසින් ග්‍රහණ 710ක් සිදුකර ඇති අතර, මින් ග්‍රහණ 584ක් හෙරොයින් හා ග්‍රහණ 96ක් ගංජා සම්බන්ධ ග්‍රහණ වේ. මහාධිකරණයේ පැවරීමට නියමිත නඩු සංඛ්‍යාව 58කි. හෙරොයින් ග්‍රහණ 584න් 04ක් සුවිශේෂී ග්‍රහණයන් වන අතර, ඒවා පිළිවෙලින් ග්‍රෑම් 1002.4ක්, 516.8ක්, 252.0ක් හා 101.2ක් වේ.

අවස්ථාවන් 07ක් තුළ අක්කර 12කට අධික ගංජා වගාවන් විනාශ කර ඇත.

දුම්කොළ බදු පනත යටතේ, බදු නොගෙවන ලද සිගරැට් ළඟ තබා ගැනීම සහ ප්‍රවාහනය කිරීමේ ග්‍රහණ 20ක් සිදු කර ඇති අතර, මින් සුවිශේෂී සිගරැට් ග්‍රහණ 02ක් වේ. ඒවා සිගරැට් ලක්ෂ 15ක් සහ 20ක් බැගින් වූ ග්‍රහණ විය. ග්‍රහණයන් 08ක් සිගරැට් ලක්ෂයක් ඉක්මවූ ග්‍රහණ අතර, අත්අඩංගුවට ගත් සමස්ත දුම්වැටි සංඛ්‍යාව 4,446,600කි. මෙම ග්‍රහණ සම්බන්ධයෙන් දඩ සහ සමථ ගාස්තු ලෙස රුපියල් 12,265,000/-ක් රජයේ ආදායමට එක් කර ඇති අතර, සමස්ත ආදායම වශයෙන් රුපියල් 15,658,750/- ලබා දී ඇත.

## 40. සුරා අපරාධ

සමාලෝචිත වර්ෂය තුළ දී, අපරාධ ග්‍රහණ 44599ක් සිදු කර ඇති අතර, දඩ මුදල් වශයෙන් රුපියල් 234,845,970/-ක් අය කර ගෙන ඇත.

සුරා අපරාධ ග්‍රහණ 38164ක් මත් ද්‍රව්‍ය ග්‍රහණ 3437ක් දුම්කොළ බදු පනත යටතේ ග්‍රහණ 1084ක් සහ දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ ග්‍රහණ 1914ක්, ඉහත කී ග්‍රහණ 44599ට ඇතුළත්ව ඇත.

## 41. තොරතුරු හා තාක්ෂණ ඒකකය

මෙම ඒකකය සුරාබදු කොමසාරිස් (පාලන/මානව සම්පත්) ගේ සෘජු අධීක්ෂණය යටතේ, ස්ථානාධිපතිවරයෙක්, සුරාබදු පරීක්ෂකවරයෙක් සහ කාන්තා සුරාබදු නියාමකවරියකගෙන් යුක්ත කාර්ය මණ්ඩලයකින් සමන්විත ය.

දෙපාර්තමේන්තුවට අනුබද්ධිත ප්‍රාදේශීය කාර්යාල කටයුතු, කොළඹ සුරාබදු ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ කිරීම හා දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුව (www.excise.gov.lk) යාවත්කාලීන කිරීම මෙම ඒකකයේ මූලික කාර්යභාරය වේ. එමෙන්ම, දෙපාර්තමේන්තු නිලධාරීන් හට පරිඝණක පුහුණුව ලබා දීමත්, පරිගණක සම්බන්ධයෙන් මතු වන ගැටලු නිරාකරණය කිරීම හා පරිගණක උපාංග මිලදී ගැනීම්වලදී නිර්දේශ ලබා දීම ද මෙම ඒකකය මගින් සිදු කරයි.

## 42. පහරදීම් හා අවහිර කිරීම්

රාජකාරියට බාධා කිරීමක් සම්බන්ධයෙන් දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයෙන් වාර්තා වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් පොලිසිය විසින් අංක 48394 යටතේ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත.

# සමාප්තිය

සුරාබදු ආදායම වශයෙන් 2010 වර්ෂය තුළ රුපියල් මිලියන 36,666ක් ලබා ගෙන ඇති අතර, එය 2009 වසරේ ආදායමට වඩා 28% ක වැඩිවීමකි. 2009 වර්ෂයට වඩා 2010 වර්ෂය තුළ සැර මත්පැන් හා මෘදු මත්පැන් නිෂ්පාදනයේ වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම වැඩිවීමට හේතු වූයේ :- (අ) උතුරු සහ නැගෙනහිර පලාත්වල නීතිය හා සාමය ස්ථාපිතවීම නිසා මත්පැන් අලෙවි කිරීමේ දී පැවති බාධා ඉවත් වීම, (ආ) සංචාරකයින්ගේ පැමිණීම වර්ධනය වීම, (ඇ) සුරාබදු දෙපාර්තමේන්තුව සහ පොලිස් දෙපාර්තමේන්තුව විසින් නීති විරෝධී මත්පැන් සැපයීම පාලනය කිරීම සඳහා ගත් මහා පරිමාණ ග්‍රහණ හේතුවෙන් ඒවායෙහි අඩුවීමක් සිදුවීම යන කරුණු ය. කොළඹ විශ්වවිද්‍යාලයය මගින් බස්නාහිර සහ වයඹ පළාත් ආවරණය වන පරිද්දෙන් සිදු කෙරුණ පර්යේෂණයක් තුලින් මේ බව සනාථ කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් සුරාබදු ග්‍රහණ 44599 ක් සිදු කරන ලදී.

ප්‍රතිපත්ති විධානයන් හා මාර්ගෝපදේශකත්වය සලසා දීමෙන් මාගේ ක්‍රියාකාරීත්වයට ශක්තිය ලබා දුන් අතිගරු ජනාධිපති තුමාටත්, මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, දෙපාර්තමේන්තුව නිසි මග මෙහෙවීමෙන් හා නිරන්තර ප්‍රගති සමාලෝචනය තුළින් මාගේ කාර්යභාරය සාර්ථක කර ගැනීමට ජවය ලබා දුන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාටත්, සම්බන්ධීකරණ හා නිරන්තර උපදෙස් ලබා දීමෙන් බාධක මග හරවා ගැනීමට දායකවූ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්ටත්, දෙපාර්තමේන්තුවේ කටයුතු සාර්ථක කර ගැනීමට නන් අයුරින් සහය දුන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලැබුණු සහාය අගය කරමි. තවද, දෙපාර්තමේන්තුව සමග සුහදව හා සමීපව කටයුතු කර, එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීමට සහාය දැක්වූ ජාතික අන්තරායකාරී ඖෂධ පාලන මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, දුම්කොළ හා මද්‍යසාර අධිකාරිය හා අනෙකුත් රාජ්‍ය ආයතනයන්ට මාගේ කෘතඥ පූර්වක ස්තුතිය පුද කර සිටිමි.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා පුහුණු අවස්ථා සලසා දීමෙන් දායක වූ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය, මානව හිමිකම් කොමිසම, අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව, ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් කමිටුව සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය යනාදී ආයතනයන්ට ද මාගේ කෘතඥතාවය හිමිවේ.

එමෙන්ම, ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතිපාදන සපයන මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන විසින් මෙම දෙපාර්තමේන්තුවට විදේශ පුහුණු අවස්ථා ලබා දීමෙන් දක්වන ලද අනගි සහායට විශේෂයෙන් ස්තුතිය පිරිනමමි.

අවසන් වශයෙන් මාගේ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය වෙමින් දෙපාර්තමේන්තු අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වූ දෙපාර්තමේන්තුවේ සියලුම ශ්‍රේණිවල නිලධාරීන්ට මාගේ විශේෂ ස්තුතිය හිමිවිය යුතුය.

**වසන්ත හපුආරච්චි**
සුරාබදු කොමසාරිස් ජනරාල්